ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය

## 17



පෙරදින රැයේ බිව් මත්පැන් නිසා දිලීප සිටියේ තෝන්තුවෙනි. මත් ගතිය තවමත් දැනෙයි. වාහනය පදවාගෙන ගුවන් තොටුපලට එන්නට තරම් හැකියාවක් තමාට නොහැකි බව ඔහු තේරුම් ගෙන සිටියේ ය. දින කීපයක් එක දිගට බිව් මත්පැන් විසින් සිරුර අකර්මණ්‍ය කර ඇති බවක් ඔහුට දැනෙයි. හිසේ කැක්කුම දරා ගන්නට නොහැකි තරම් දැඩිව ඔහුට දැනුණි. උදෑසන බොන්නට ගත් වතුර වීදුරුව පවා ඔහු අතින් ගිළිහී බිම වැටුණි. අතපය තමාට අවනත නැති බවක් ඔහුට දැනුණි. එනමුදු අනුරාධගෙන් පළිගැනීමේ වියරු චේතනාව සියලු අපහසුකම් මැඩ සිතේ බලවත්ව නැගී සිටියේ ය.

ඔහු සිය වාහනයට නැග ගත්තේ පවා මහත් අපහසුවෙනි. වාහනය පණගන්වනවා වෙනුවට ඔහු සුක්කානම මත හිත තබා ගත්තේ ය. දෑස් පියාගත් ඔහු අපහසුවෙන් හුස්ම ගත්තේ ය. වාහනය පණගන්වා ඉදිරියට ගෙන යාමට තරම් ශක්තියක් තම සිරුරේ ඉතිරිව නැති බවක් ඔහුට හැඟුණි.

තමා කොපමණ වේලාවක් ඒ ඉරියව්වෙන් සිටියාදැයි ඔහුට නිනව්වක් නොවී ය. මේ ගමන යන්නට සිය සිතේ ශක්තිය පමණක් සෑහේ යයි ඔහුට සිතුණි. යතුර කරකවා වාහනය පණගන්වාගත් දිලීප බොහෝ සීරුවෙන් එය පාරට ගත්තේ ය. ගුවන් තොට දක්වා තමා වාහනය කෙසේ පදවාගෙන අවේ දැයි කියන්නට වත් ඔහු නොදැන සිටියේ ය. යාන්ත්‍රික මිනිසකු සේ වාහනය රිය ගාලේ නතර කළ දිලීප මහත් අපහසුවෙන් මගී පර්යන්තයට ඇතුල් වූවේ ය.

රැස්ව සිටි සෙනග අතරින් ඇවිද ගිය ඔහු කණුවකට වාරු වී සිට ගත්තේ ය. අනුරාධ ගේ දෑතට සිරව ගත් නිෂාධි ඈත කෙළවරේ සිටිනු ඔහු බලා සිටියේ සිහිනයක් දකින්නාක් සේ ය.

''නිෂාධි..'' යි කෑ ගසන්නට ඔහුට අවශ්‍යව තිබුණි. ඉදිරියට පැන අනුරාධගේ පහසින් ඇය ගලවා ගන්නට ඔහුට අවශ්‍ය විය. තමා සතු වස්තුවක් උදුරාගන්නට ඔහුට අයිතියක් නැත .

නිවසින් පිට වන්නට පෙර උල් පිහියක් අතට ගත් බව ඔහුට මතක ය. පිහියකින් ඇන අනුරාධ මරා දැමිය යුතුය යන යැඟීම ඒ පිහිය අතට ගත් මොහොතේ ඔහු සිත තුළ විය. ඉන්පසු ඒ පිහියට කුමක් වූවා දැයි දැන් ඔහුට නිනව්වක් නැත. ඒ මොහොතේ සිත තුළ බුර බුරා නැගි ක්‍රෝධය වෙනුවට මහත් ආත්මානුකම්පාවක් ඔහුට ඇති විය. තමා අසරණව ඇති බවක් ඔහුට දැනුණි.

නිෂාධි හා අනුරාධ දෙස තව දුරටත් බලා සිටීමේ හැකියාවක් ඔහුට නොවී ය. ඔහු කණුවෙන් මෑත්ව අසළ වූ අසුනක වාඩි වූයේ ය. බොහෝ වේලාවක් බිමට නැඹුරු කරගත් හිසින් සිටියේ ය. නැවත හිස ඔසවා බලන විට නිෂාධි හෝ අනුරාධ හෝ ඔහුගේ දසුන් මානයේ නොසිටියේ ය.

ගිම්හාන බොල් සුළඟ මේ තරම්
රුදුරු දැයි කෙළෙස පිළිගනිම් මං
ජීවිතය සරදමක් ලෙසින් දැන්
දැනුණි නොදැනුණා ලෙස සිටින්නම්

ඉඳුසැව්ව සිහිනයකි පෙර දිනේ
බෝ කල්ය ඒ සිහින නැති වුණේ
හසරැල්ල නුඹ මුවේ පිබිදුණේ
මා නිසා නොවන බව වැටහුණේ

00000000000

''මේ තමයි මගේ පුංචි නිවහන.... හිනාවෙන්න එපා මහත්තයා.. මං හුඟක් දුප්පත්..'' නිෂාධි දොර අරින අතර කීවාය.

''මිනිස්සු දුප්පත් ද පෝසත්ද කියලා මං මනින්නෙ භෞතික සම්පත් වල වටිනාකමින් නෙවෙයි..'' අනුරාධ කීවේ ඇය පසුපසින් නිවසට ඇතුල් වන අතර ය.

''අප්පා.. බොහොම බැරෑරුම් කතාවක් කිව්වෙ උදේ පාන්දරම..'' නිෂාධි සිනාසුණා ය. ''.. ඔක්කොටම ඉස්සෙල්ලා මං ඔයාට තේ එකක් හදන්නම්.. ඊයේ රෑ මොනාද කෑවෙ..?''

''කන්න ආසාවක් තිබුණෙ නෑ.. මහන්සියට.. ඒත් ඒ මිනිස්සුන්ගෙ හිත රිද්දන්න හොඳ නැති නිසා පෝඩ්ඩක් කෑවා.. හරියට නින්ද ගියෙත් නෑ.. ඔහේ පෙරළි පෙරළි හිටියා.. උදේ වෙනෙකොට තමයි නින්දක් ටිකාක් නින්ද ගියේ.. ''

''මං ආවෙ නැත්නං තාම නිදි නේද..? පව්..''

''ඇයි.?''

''මං ඔයාගෙ නින්ද කැඩුවානෙ..''

අනුරාධ සිනාසුණේ ය.

''එහෙම නින්ද කඩපු එකට සතුටුයි.. මං මේ ගමන ආවේ නිදා ගන්න නෙවෙයි.. ඔයා දැක ගන්න'' ඔහු කීවේ ය.

''හැබැයි ඔයා මං එක්ක ආව එක ගැන මිස්ටර් පෙරේරගෙ හික නම් හොඳ නෑ වගේ.. මං දැක්කා ඔයා එනවා කිව්ව ගමන් එයාගෙ මූණ වෙනස් වුණ හැටි..''

''එයාල කැමති නෑ අපි යාලුවන් එක්ක යනවට.. මට ඒක සුදත්තත් කිව්වා.. ටිකට්ස් වලට සල්ලි ගෙවලා අපට මෙහාට ගෙනාවෙ එයාලා තමයි.. ඒත් ඉතින් අපි කොහොමද හිරකාරයෝ වගේ ඉන්නෙ..?'' අනුරාධ නිෂාධි ගෙන ආ තේ කෝප්පය අතට ගත්තේ ය.

''ඔය ප්‍රශ්නෙ පැති දෙක තුනක් තියෙනවනෙ.. මෙහාට ආටිස්ට්ලා ගෙන්නන සමහර අය හිතනවා අපි වියදම් කරලා ගෙනාව නිසා අපි කියන විදිහට මෙයාල ඉන්න ඕනෙ කියලා.. ඒ කියන්නෙ අයිතිවාසිකමක් වගේ.. අනිත් අතකින් ඒ මිනිස්සුන්ටත් සාධාරණ බයක් තියෙනවා.. මෙහෙට එන සමහර අය කරන වැඩ නිසා.. සමහරු බලන්නෙම හොරෙන් පනින්නමනෙ.. ඒත් ඉතින් ඔයා වගේ ලංකාවෙ ලීඩිං ඇක්ටර් කෙනෙක් ගැන එහෙම හිතන එක නම් පිස්සුවක්..''

අනුරාධ මොහොතක් ඇය දෙස බලා සිටියේ ය.

''කල්පනා කරනකොට පිස්සුවක්මත් නෙවෙයි... මං ඇත්තම කියන්න ද? මටත් හිතෙනවා ආපහු නොයා ඉන්න..'' ඔහු කීවේ ය. ''මං කොහොමද ඔයා දාලා ආපහු යන්නෙ..? හිතන්නවත් බෑ..''

''පිස්සා... '' ඇය කීවා ය.

අනුරාධ අසුනක වාඩි වූයේ කුඩා නිවහන පුරා බැල්මක් යවමිනි. සාලයේ කෙළවරක කුඩා රූපවාහිණී යන්ත්‍රය මත වූ තම සේයාරුව අසළ ඔහුගේ බැල්ම නැවතුණි. ඔහු නැගිට ගොස් එය අතට ගත්තේ ය. ඇස් කඳුලින් පිරෙනු ඔහුට දැනුණි. සේයාරුව අතෙහි තබාගත්වනම ඔහු ඇය දෙස බැලුවේ ය.

තමාට අඩි කීපයක් ඈත සිට ඈ තමා දෙසම බලා සිටිනු ඔහු දුටුවේ ය.

'' එක මොහොතක් වත් මං ඔයාගෙන් ඈත් වුණේ නෑ..'' ඈ මිමිණුවා ය. ඔහු පුටුවෙන් නැගිට ඇය වෙත ගියේ ය.

''මාත් එහෙමයි.. මේ මාස කීපය ගෙවුණෙ පිස්සුවෙන් වගේ.. '' ඔහු පහත් හඬින් කීවේ ය. ඔහු දෑත් විහිදූ විට ඈ ඒ දෑත් අතරට පාව ආවා ය. ඔහු මෘදු ලෙස ඇය වැළඳ ගත්තේ ය.

නිෂාධි ඉකිබිඳිණු අනුරාධට දැනුණි. ඔහු කිසිවක් කියා ගත නොහැකිව තව තවත් ඈ තමා වෙතම තුරුලු කර ගත්තේ ය. කල්පයක් බලා සිට රාජ්‍යයක් දිනා ගත්තාක් වැනි සහනයක් ඒ සමගම ඔහු සිතට ඇතුල් විය.

''අඬන්න එපා..'' ඔහු බොහෝ වේලාවකට පසු කීවේ ය. ''.. මං ආවනේ..''

ඈ හිස ඔසවා ඔහුගේ මුහුණ බැලුවා ය. ඔහු දෑතින්ම ඇගේ දෙකොපුල් මත තැවරුණ කඳුළු පිසදැම්මේ ය. ඈ සිනාසුණා ය. කඳුලු අතරින්ම සිනාසුණා ය.

''කොයි තරම් කාලයක් ගියා ද?.. හරියට කල්ප ගාණක් ගියා වගේ..'' ඔහු නැවත කීවේ ය.

''හ්ම්... කල්ප ගාණක් වගේ..'' ඈ මිමිණුවා ය.

කියන්නට බොහෝ දේ තිබුණ ද අසන්නට බොහෝ දේ තිබුණ ද ඔවුහු නිහඬව ම බොහෝ වේලාවක් ගත කල හ. ඔහුගේ දැඩි ආලිංගනය තුළ සිරව කල්පයක් හෝ ගෙවන්නට කැමැත්තක් ඇගේ සිතේ ගොඩ ගැසී තිබුණි.

''ඒයි....'' ඈ හදිසියේ කෑ ගැසුවා ය.

''ඇයි..?'' ඔහු ඇසුවේ ය.

''ඔය හැටි හිර කර ගත්තම අපේ දරු පැටියට රිදෙයි ළමයෝ..'' ඈ ඔහුගේ කනට ළං වී කීවා ය. ඔහු වහා සිය ග්‍රහණයෙන් ඈ මිදෙව්වේ ය. ''..ඔය තරම් බය වුණාම ඇති..'' ඈ සිනාසුණා ය.

''අපේ දරු පැටියා..'' අනුරාධ මිමිණුවේ ය. ''.. අනේ නිෂා.. අපේ දරු පැටියා ඉපදෙනකොට මට ඔයා ළඟ ඉන්න ලැබෙයි ද..''

ඈ සිය දකුණතින් ඔහුගේ මුව වැසුවා ය. ''දුක් වෙන්න එපා.. හැම දේම හොඳින් සිදුවේවි.. අපි බලා ඉමු.. දැන්ම කල්පනා කරලා හිත රිදවා ගන්න එපා..''

000000

''මට ඒ වෙලාවෙ මරාගෙන මැරෙන්න හිතුණා..'' දිලීප කීවේ ය. මුලුතැන්ගෙයි මේසය පිස දමමින් සිටි සඳලි හිස හරවා බැලුවා ය.

ඈ ඔහු සොයා ආවේ දින කීපයක් එක දිගට ඔහු විශ්ව විද්‍යාලයට නො ආ බැවිනි. නිවසට ඇතුල් වත්ම ආ පිලුණු ගඳ හා මත්පැන් ගඳ ඇගේ සිතේ ඇති කළේ මහත් අපුලකි.

''විහින් විනාස වෙන්න හදනවා..'' ඈ කීවේ වාඩි වන්නටත් පෙර ය. අප්‍රාණික ලෙස පුටුවත විටී සිටි ඔහුගේ මුහුණ පුරා වැඩී තිබුණේ දින කීපයක් නොකැපූ රැව්ලකි. බොකුටු කොණ්ඩය තවත් අවුල් වී මුහුණට වැටී තිබුණි. ගිලීගිය ඇසින් ඔහු හෙළූ බැල්ම ඇගේ සිත අනුකම්පාවෙන් පුරවාලූයේ ය.

ඈ ඔහු ඉදිරියේ වූ පුටුවේ වාඩි වූයේ බිම පෙරළී තිබූ මත්පැන් බෝතල දෙකක් පාදයෙන් මෑත් කරමිනි.

''දෙයියන්ගෙ නාමෙන් මට කියන්න මොකක්ද මේ වෙලා තියෙන්නෙ කියලා.. හංගන්න එපා..

21 වන පිටට